# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2283/39 - 2022 ජුනි මස 10 වැනි සිකුරාදා - 2022.06.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනත**

64(5) වන වගන්තිය යටතේ පුරප්පාඩුවක් පිරවීම

පිළිගත් දේශපාලන පක්ෂයක් වන ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ පක්ෂය විසින් නාමයෝජනා කරන ලදුව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 99අ ව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව ප්‍රකාශයට පත්කරන ලද බැසිල් රෝහණ රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක පුරප්පාඩුවක් ඇති වී තිබෙන බව, 1988 අංක 35 දරන ඡන්ද විමසීම් (විශේෂ විධිවිධාන) පනතේ 6 වන වගන්තියෙන් සංශෝධිත, 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64(5) වන වගන්තිය යටතේ පාර්ලිමේන්තුවේ මහලේකම් විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත දැනුම් දී ඇති හෙයින් ද;

එකී පුරප්පාඩුව පුරවනු පිණිස එකී දේශපාලන පක්ෂයේ ලේකම්වරයාට ඉහතකී වගන්තිය යටතේ සුදුසුකම් ඇති එම පක්ෂයේ සාමාජිකයෙකු නාමයෝජනා කරන ලෙස මැතිවරණ කොමිෂන් සභාව විසින් නියම කරනු ලැබ ඒ අනුව,

ඉහත කී දේශපාලන පක්ෂයේ ලේකම් වරයා විසින් එම පුරප්පාඩුව පුරවනු පිණිස කුලප්පු ආරච්චිගේ දොන් ධම්මික පෙරේරා මහතා නාමයෝජනා කර ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සමග කියවිය යුතු 1981 අංක 1 දරන පාර්ලිමේන්තු මැතිවරණ පනතේ 64 (5) වන වගන්තිය ප්‍රකාර ක්‍රියා කරමින්, ඉහත කී බැසිල් රෝහණ රාජපක්ෂ මහතා ඉල්ලා අස්වීම හේතුකොට ගෙන ඇති වූ පුරප්පාඩුව පිරවීම සඳහා කුලප්පු ආරච්චිගේ දොන් ධම්මික පෙරේරා මහතා පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස තෝරා පත්කර ගන්නා ලද බව මැතිවරණ කොමිෂන් සභාව විසින් මෙයින් ප්‍රකාශයට පත්කර නිවේදනය කරනු ලැබේ.

නිමල් ජී. පුංචිහේවා
සභාපති
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. බී. දිවාරත්න
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව.

එම්. එම්. මොහමඩ්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව.

කේ. පී. පී. පතිරණ
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව.

පී. එස්. එම්. චාල්ස්
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව.

2022 ජුනි මස 10 වැනි දින,
රාජගිරිය,
මැතිවරණ කොමිෂන් සභාවේ දී.

EOG 06 - 0102

1A - G 036924 — 370 (2022/06)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*